ඇමුණුම - 01

**වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහාවන ජාතික අරමුදල මඟින් වැඩිහිටි දිවා මධ්‍යස්ථානවලට උපකරණ ලබාදීම සඳහා අරමුදල් නිදහස් කිරීම - 2024**

**උපදෙස් පත්‍රිකාව**

## 01. ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීම

ග්‍රාමීය මට්ටමේදී වැඩිහිටියන්ගේ සුබසාධන , ආදායම් උත්පාදන වැඩසටහන් හා අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට මෙන්ම සාමූහික ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් සඳහා මෙම මධ්‍යස්ථාන ප්‍රදේශයේ වැඩිහිටි පිරිසට ඉතා ප්‍රයෝජනවත් වේ. ඒ අනුව උක්ත වැඩසටහන් පැවැත්වීමට විවිධ භාණ්ඩ හා උපකරණ අවශ්‍ය වන අතර වැඩිහිටි සමිතිවලට මේ සඳහා මූල්‍ය වත්කම් නොමැත. දිවා මධ්‍යස්ථානයක වැඩිහිටියන් රැස්වී වැඩසටහන් සංවිධානය කරන බැවින් ඒ සඳහා අවශ්‍යය භාණ්ඩ හා උපකරණ ලබාදිම වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සංකල්පයේ සාර්ථකත්වයට ඉවහල් වේ.

ඒ අනුව සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි මෙම වර්ෂය තුළ රුපියල් 500,000.00 ක උපරිමයකට යටත්ව දිවා මධ්‍යස්ථානවලට උපකරණ මිලදී ගැනීමට ප්‍රතිපාදන ලබාදිමට මුදල් වෙන්කර ඇත.

## 02.තෝරා ගැනීමේ නිර්ණායක

1. සක්‍රීය වැඩිහිටි සමිතියක් හා සම්බන්ධ දිවා මධ්‍යස්ථාන සහ වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් ඉදිකරන ලද හෝ දැනට නිරවුල් ඉඩමක පවත්වාගෙන යනු ලබන වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා ප්‍රමුඛතාවය හිමි විය යුතුය.
2. වැඩිහිටි සමිතියේ ඉල්ලීම් ලිපිය
3. වර්තමාන ක්‍රියාකාරීත්වය පිළිබඳ විෂය භාර ක්ෂේත්‍ර නිලධාරිවරයාගේ වාර්තාව
4. මෙම වර්ෂය සඳහා අනුමත කරන ලද යෝජිත වැඩ සැලැස්ම
5. ප්‍රාදේශිය ලේකම් ගේ අනු අත්සන සහිත භාණ්ඩ විස්තරය හා ඇස්තමේන්තුව
6. භාණ්ඩ හා උපකරණ වෙනත් පාර්ශවයකට හෝ පුද්ගලයෙකුට නොපවරන බවට ලිපිය හා භාණ්ඩ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධ භාරකරුගේ එකඟතා ප්‍රකාශිත ලිපිය
7. මේ සඳහා ඉල්ලුම් කළ හැකි අවසාන දිනය 2024. 10.30 වේ

## 03.ඉල්ලුම් කළ හැකි භාණ්ඩ වර්ග

1. විදුලි උපකරණ
2. ගෘහ භාණ්ඩ
3. මුළු තැන්ගේ උපකරණ
4. පුස්තකාල පොත්
5. ගෙවතු වගා උපකරණ
6. ප්‍රථමාධාර උපකරණ
7. ක්‍රිඩා උපකරණ
8. සංගීත භාණ්ඩ
9. වෙනත්

## 04. ක්‍රියාත්මක ක්‍රමවේදය

1. ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුව රුපියල් 500,000.00 ක මුල්‍ය ප්‍රතිපාදන සීමාව ඉක්මවා නොයා යුතුය.

2. එක් දිවා මධ්‍යස්ථානයක් සඳහා ලබාදෙන උපරිම මුදල වන රුපියල් 500,000.00 එක්වරක් පමණක් ලබාදෙනු ඇත.

3. සියලුම ලේඛණ හා වාර්තා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතුය

**4.ප්‍රසිද්ධ නිවාඩු දිනයක් නොවන්නේනම් <u>සතියේ දින 5 තුළම විවෘතව තැබිම අනිවාර්යවන අතර ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකරන දිවා මධ්‍යස්ථාන මේ සඳහා සුදුසුකම් නොලබනු ඇත.. තවද වැඩිහිටියන්ට තම අවශ්‍යතාවය පරිදි පැමිණීමට හා පරිහරණය කිරිමට අවස්ථාව සලසා දිය යුතු අතර ඒ සඳහා දිවා මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ආයතනය වන ග්‍රාමීය වැඩිහිටි කමිටුවේ/ වැඩිහිටි බලමණ්ඩලයේ කැමැත්ත ප්‍රකාශිත ලිපියක් ඉදිරිපත් කළ යුතුය. ( ක්ෂෙත්‍ර නිලධාරි නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය සහිතව එම ප්‍රකාශය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉල්ලුම් පත්‍රය සමග ලබාදීමට කටයුතු කළ යුතුය. )</u>**

## 05. ඉල්ලීම් කිරිම හා ප්‍රගතිය ලබාදිම

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු අතර ඒ ඒ කාර්යයන් නිමකල වහාම ඡායාරූප සහිත ප්‍රගතිය මා වෙත යොමු කළ යුතුය.

1. මුදල් ලද බවට ලදුපත
2. මිලදි ගත් භාණ්ඩ පිළිබඳ බිල්පත්
3. උපකරණ හා භාණ්ඩ දිවා මධ්‍යස්ථානවලට ලබාදුන් බවට ලිපිය

**පසුවිපරම්**

1. සියලුම භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කළ යුතුය
2. ඒ ඒ අවස්ථාවේ පසු විපරම් කටයුතු දිස්ත්‍රික් නිලධාරියා විසින් සිදුකර අවශ්‍ය වන්නේ නම් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට වාර්තා කළ යුතුය.
3. අදාළ ලේඛන යාවත්කාලිනව පවත්වා ගැනීමට සුදුසු උපදෙස් හා පුහුණුව වැඩිහිටි සමිතියට හා දිවා මධ්‍යස්ථාන සාමාජිකයන්ට ලබාදිය යුතුය.
4. ලබාදෙන භාණ්ඩ හා උපකරණ හානී සිදුවූ අවස්ථාවල, නඩත්තු හා නැවත සැකසීමට වැය වන වියදම් වැඩිහිටි දිවා මධ්‍යස්ථානය අයිති වැඩිහිටි සමිතිය/ බලමණ්ඩලය විසින් දැරිය යුතුය.

**06. ඉල්ලීම් ඉදිරිපත් කිරිම හා ප්‍රගතිය ලබාදිම**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු අතර ප්‍රගතිය පහත සඳහ් ලියකියවිලි සමග මා වෙත යොමුකල යුතුය.

1. මුදල් ලද බවට ලදුපත
2. මිලදි ගත් භාණ්ඩ පිළිබඳ බිල්පත්
3. උපකරණ හා භාණ්ඩ දිවා මධ්‍යස්ථානවලට ලබාදුන් බවට ලිපිය

කේ.ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ